ඉතිහාසය

7 පාඩම

# වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නව රාජධානි බිහිවීම.

විෂය අන්තර්ගතය

- වියළි කලාපීය පැරණි නගර බිඳ වැටීම

  නගර බිහිවීම

  නගර බිඳ වැටීමට හේතු

- දෙවන නාගරීකරණය

  දඹදෙණිය,යාපහුව,කුරුණෑගල,කෝට්ටේ,යාපනය,වන්නියාර්වරු

- ආර්ථික රටාව
- ආගම
- කලාව සහ ගෘහනිර්මාණය
- සාහිත්‍ය

නිපුණතාව

රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය සහ බිඳවැටීම නිසා සමාජයේ විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් විග්‍රහ කරයි.

ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ග්‍රාමීය ජනාවාස නාගරික ජනාවාස දක්වා වර්ධනය වීම සහ ඒවා රාජධානි බවට පත් වීමත් පසුව ක්‍රමයෙන් පරිහානිය කරා ලඟා වීමත් පසුකාලීනව රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමත් පිළිබඳව කරුණු අධ්‍යයනය කිරීම මෙම පාඩමෙහි අරමුණයි.

## 7.1 නාගරික ජීවිතයට පසුබිම සකස්වීම

ප්‍රාග් ඓතිහාසික ජනයා දඩයම් ජීවිතය අතහැර ස්ථිරවාසීතාවයට හුරු විය.

(එක්තැනක දිගු කාලයක් ජීවත් වීම)

↓

ස්ථිරවාසීතාවය පැරණි ගම්මාන බිහිවීමට හේතු වීම

↓

එසේ බිහි වූ ගම්මාන වල ගොවිතැන පදනම් කරගෙන ආර්ථික වශයෙන් ශක්තිමත් වූවන් සහ ආර්ථික වශයෙන් දුර්වල වූවන් බිහිවීම.

↓

සමාජ ස්තරායනය ඇති වීම.(පන්තිභේදය)

↓

නායකයන් බිහිවීම.

↓

නගර බිහිවීම.

↓

රාජධානි බිහිවීම.


## 7.2 පළමුවන නාගරීකරණය

- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අසිරිමත් පුරවරයන් ලෙස ක්‍රියාත්මක වූ පැරණි නගර දෙකකි.
    - උතුරු මැද වියළි කලාපයට අයත් අනුරාධපුර නගරය
    - දකුණු වියළි කලාපයට අයත් මාගම නගරය


- ක්‍රි.පූ 450 වන විට මෙම නගර දෙකෙහි උසස් ජීවන තත්වයකට උරුමකම් කියන ජනතාවක් වාසය කලහ .

- පළමුවන නාගරීකරණයේ දී බිහිවූ රාජධානි දෙකකි.
    - අනුරාධපුර
    - පොළොන්නරුව

- **පළමුවන නාගරීකරණයේ දී සමාජය තුළ කැපී පෙනුණු ලක්ෂණ කිහිපයකි.**
  - **ධනවත් ප්‍රභූ පිරිසක් සිටීම.**
  - **පරිපාලන යාන්ත්‍රණයක් තිබීම.**
  - **විදෙස් රටවල් සමඟ වෙළඳ සබඳතා.**
  - **සැලසුම් සහගත නගර ඉදිකිරීම.(බලකොටු,ප්‍රාකාර,ජලාශ,ආගමික ගොඩනැඟිලි සහිත)**




**සිතියම 7.1-පැරණි අනුරාධපුර නගර සැලසුම**




**සිතියම 7.2-පැරණි පොළොන්නරුව නගර සැලසුම**

## 7.3 පොළොන්නරුව බිඳ වැටීම

- දුර්වල පාලකයන් බලයට පත් වීම.
    - චෝඩගංග
    - සහස්සමල්ල
    - කළ්‍යාණවතී බිසව

- කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය

**කාලිංග වංශික**

විජයබාහු + තිලෝකසුන්දරී
↓
නිශ්ශංකමල්ල
↓
චෝඩගංග
↓
සහස්සමල්ල
↓
කළ්‍යාණවතී

**පාණ්ඩ්‍ය වංශික**

1වන පරාක්‍රමබාහු +ලීලාවතී
↓
ලීලාවතී බිසව තෙවරක් රජ වීම.

- ආර්ථික පරිහානිය
    - වැව් අමුණු නඩත්තු නොකිරීම.
    - කෘෂි ආර්ථිකය බිඳ වැටීම.
    - වෙළඳ ආර්ථිකය බිඳ වැටීම.

- කාලිංග මාඝ ආක්‍රමණය
    - කාලිංග මාඝ ආක්‍රමණයෙන් දිවි බේරා ගැනීම සඳහා රජරට වැසියන් මලය රට,රුහුණු රට,මායා රට ආදී ප්‍ර දේශවලට පලා යෑම.
    - පසුකාලීනව එකී ප්‍ර දේශවලින් නායකයින් බිහිවීම.
        - යාපහුව-සුභ සෙන්පති
        - ගංදෙණිය පර්වතය-සංඛ සෙන්පති
        - ගෝවින්දමලය-බුවනෙකබාහු ආදිපාද
        - දඹදෙණිය-විජයබාහු

## පැරණි නගර නගර පරිහානියට හේතු


- සතුරු ආක්‍රමණ.
- මධ්‍යගත පාලනය බිඳ වැටීම.
- ආරක්ෂාව නැති වීම.
- වෙළඳ හා ගමනාගමන කටයුතු අඩපණ වීම.
- ජනතාව වෙනත් ප්‍ර දේශ වලට සංක්‍රමණය වීම.

## 7.4 දෙවන නාගරීකරණය

### දඹදෙණිය රාජධානිය

### තුන්වන විජයබාහු රජු (ක්‍රි.ව 1232-1236)

- දඹදෙණිය පාලන මධ්‍යස්ථානය බවට පත්කර ගැනීම.
- බෙලිගල දළදා මැදුරක් ඉදිකර දළදා වහන්සේ එහි තැන්පත් කරවීම.
- දඹදෙණිය විජයසුන්දරාරාමය ඉදිකරවීම.
- කැළණිවිහාරය ප්‍රතිසංස්කරණය කිරීම.
- උපසම්පදා මංගල්‍යයක් යළි පවත්වා සංඝ සංශෝධනයක් සිදුකිරීම.
- අභාවයට ගිය ග්‍රන්ථ නැවත රචනා කිරීම.




සිතුවම 7 1-පැරණි සංග්‍රාම අවස්ථාවක් චිත්‍ර ශිල්පියකුගේ ඇසින්

## දෙවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව 1236-1270)

- **කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබීම.**
- **ක්‍රි.ව 1247 දී චන්ද්‍රභානුගේ පළමු ආක්‍රමණයෙන් රට මුදවා ගැනීම.**
- **වසර 40ක් රජරට පාලනය කළ මාඝගේ පාලනයෙන් මෙරට මුදා ගැනීම.**
- **ක්‍රි.ව 1261 දී චන්ද්‍රභානුගේ දෙවන ආක්‍රමණයෙන් රට මුදා ගැනීම.**
- **දේව පතිරාජ ඇමතියා ලවා ආර්ථික,ආගමික හා අධ්‍යාපනික යන අංශයන්හි ප්‍රබල දියුණුවක් කිරීම.**



**යාරූපය 7.1- දඹදෙණිය විජයසුන්දරාරාමය**

## යාපහුව රාජධානිය

### පළමුවන බුවනෙකබාහු රජු (ක්‍රි.ව1272-1284)

- යාපහුව අගනුවර වශයෙන් තෝරා ගැනීම.
- වන්නි නායකයින් කැරලි ඇති කිරීම.
- දකුණු ඉන්දීය සෙන්පතීන් වූ කලිංගරායර හා චෝඩගංග යන අයගේ හමුදාවන් මෙරට ආක්‍රමණය කිරීම.
- ඊජිප්තුව ඇතුළු විදෙස් රටවල් සමඟ වෙළඳ සබඳතා ඇතිකර ගැනීම.


## කුරුණෑගල රාජධානිය

### හතරවන පරාක්‍රමබාහු රජු


- පන්සිය පනස් ජාතකපොත සිංහලට පරිවර්තනය කිරීම.

### තුන්වන බුවනෙකබාහු රජු (වන්නි බුවනෙකබාහු)

- කුරුණෑගල වැව තැනවීම.




සිතියම 7.3-පැරණි යාපහුව නගරයේ සැලැස්ම




සිතියම 7.4-පැරණි කුරුණෑගල නගරයේ සැලැස්ම

## ගම්පොළ රාජධානිය

<u>හතරවන බුවනෙකබාහු රජු</u>

- **ගම්පොළ රාජධානිය බවට පත් කර ගැනීම.**
- **ගඩොලාදෙණිය හා ලංකාතිලක විහාර ඉදිකිරීම.**



ඡායාරූපය 7.2- ලංකාතිලක විහාරය

<u>තුන්වන වික්‍රමබාහු රජු</u>

- උතුරේ ආර්ය චක්‍රවර්තීන් ගම්පොළ රාජධානියට පැමිණ බදු අයකර ගැනීම.
- රජුගේ ප්‍රධාන ඇමතිවරයා වූ නිශ්ශංක අලකේශ්වර විසින් කෝට්ටේ බලකොටුවක් තනාගෙන ආර්ය චක්‍රවර්තීන් පරාජය කිරීම.

- ගම්පොළ රාජධානියේ අවසාන කාලයේ දී යුංලෝ නම් චීන අධිරාජ්‍යා ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීම.

## කෝට්ටේ රාජධානිය

<u>හයවන පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව 1415-1467)</u>

- කෝට්ටේ රාජධානිය පිහිටවීම.
- වන්නි ප්‍රදේශය කෝට්ටේ රාජ්‍ය යටතට පත් තර ගැනීම.
- සපුමල් කුමරු යටතේ හමුදාවක් යවා යාපනය රාජ්‍ය ජය ගැනීම.
- ජෝතිය සිටුවරයා ඇතිකළ කැරැල්ල මැඩපැවැත්වීම.

- ආර්ථික වශයෙන් රට සමෘද්ධිමත් කිරීම.
- අධ්‍යාපනික හා සාහිත්‍ය කටයුතුවල දියුණුව සඳහා විශාල සේවයක් ඉටු කිරීම.

### හයවන බුවනෙකබාහු (සපුමල් කුමරු)

- සිංහල සංගෙ නමින් කැරැල්ලක් ඇති වීම.

### අටවන වීර පරාක්‍රමබාහු රජු (අම්බුලුගල කුමරු)

- පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණීම (ක්‍රි.ව 1505).

### යාපනය රාජධානිය

- ක්‍රි.ව දහතුන්වන සියවසේ දී රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව යාපනය ප්‍ර දේශය ආශ්‍රිත ව බිහිවූ පාලන ඒකකය යාපනය රාජධානිය ලෙස හැඳින්වේ.
- යාපන රාජධානියේ ආරම්භක පාලකයා විජය කුලංකෙ ආර්ය චක්‍රවර්තී ලෙස සැලකේ.
- යාපන රාජධානිය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීමේදී යාල්පාන වෛපව මාලෛ, කෛලාය මාලෛ,ශේගරාශශේකර මාලෛ වැනි ග්‍රන්ථ වැදගත් වේ.

### වන්නියාර්වරු

- රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව නැගෙනහිර,උතුරු මැද හා වයඹ පළාත් වල ජන ඝනත්වය අඩු ප්‍ර දේශ ආශ්‍රිතව වන්නි නමින් හැඳින්වෙන කුඩා පාලන ඒකක කිහිපයක් නිර්මාණය වී ඇත.
- මේවායේ සිටි ප්‍රා දේශීය පාලකයෝ වන්නිවරු ලෙස හැඳින්වෙති.

## 7.4.1 ආර්ථික රටාව

- තෙත් කලාපයට වර්ෂාව හොඳින් ලැබුණු බැවින් මහ වැව් සහ වාරිමාර්ග ඉදිකිරීමේ අවශ්‍යතාවයක් නොවීම.
- ප්‍රධාන වගාව වී වගාව වූ අතර හේන් ගොවිතැන ද සිදු කිරීම.
- ක්‍රමයෙන් වාණිජ කෘෂිකර්මාන්තයට නැඹුරු වෙමින් අතිරික්ත භෝග අලෙවි කිරීම.
- විදෙස් රටවල් සමඟ වෙළඳාම.


- පුවක්,ගම්මිරිස්,එනසාල්,සාදික්කා වැනි බෝග සහ මුතු මැණික්,අලි ඇතුන්,ඇත්දළ වැනි වෙළඳ භාණ්ඩ අපනයනය කිරීම.
- ඉන්දියාව,අරාබිය,චීනය,පර්සියාව,ඊජිප්තුව වැනි රටවල් සමඟ වෙළඳ සබඳතා පැවැත්වීම.

## 7.4.2.ආගම

- ප්‍රධාන ආගම වශයෙන් බුදුදහම තව දුරටත් වර්ධනය වී පැවතීම.
- දෙවියන් කෙරෙහි භක්තියකින් හා විශ්වාසයකින් කටයුතු කිරීම.
- විදෙස් වෙළඳාම ප්‍රචලිතව පැවති තොටුපළවල් ආශ්‍රිතව ඉස්ලාම් පූජනීය ස්ථාන බිහිවීම.

## 7.4.3 කලාව , ගෘහ නිර්මාණ හා සාහිත්‍ය

- දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ ශිල්පයේ ආභාෂය ලැබීම.
- හින්දු හා මහායාන අදහස් වල බලපෑම ලැබීම.
- ගිහි පැවදි උගත් පඬිවරුන් බිහි වීම.
- අධ්‍යාපනය, භාෂාව හා සාහිත්‍ය යන ක්ෂේ ත්‍රයන්හි විශාල ප්‍ර බෝධයක් ඇති වීම.




**සිතියම 7.5 -ශ්‍රී ලංකාවේ පැරණි රාජධානිවල ව්‍යාප්තිය**

**වියළි කලාපයේ පැරණි නගර පිරිහීම හා නව රාජධානි බිහිවීම පාඩම ඇසුරින් පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

**01.**

I. ශ්‍රී ලංකාවේ පැරණි නාගරීකරණ අවධියට අයත් වියළි කලාපීය නගර 02 ක් නම් කරන්න
II. පළමුවන නාගරීකරණ අවධියේ දී බිහිවූ රාජධානි දෙක නම් කරන්න.
III. එකී රාජධානි පරිහානිය කරා ගමන් කිරීමට හේතු වූ කරුණු මොනවාද?

**02.**

I. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් පසුව ශ්‍රී ලංකාවේ උතුරු ප්‍ර දේශයේ බිහිවූ රාජධානිය කුමක්ද?
II. එම රාජධානියේ පාලක පරපුර හැඳින්වූ නම කුමක්ද?

**03.** පහත සඳහන් කාර්යයන් හා සම්බන්ධ පාලකයින් නම් කරන්න

I. අනුරාධපුර සියලු නගරාංගවලින් සමන්විත පාලන මධ්‍යස්ථානයක් බවට පත් කිරීම -
II. රජරට චෝළ ආධිපත්‍ය යෙන් මුදාගෙන පාලන මධ්‍යස්ථානය ලෙස පොළොන්නරුව තෝරා ගැනීම -
III. කාලිංග මාඝ ආධිපත්‍ය යෙන් මෙරට මුදවා ගැනීම -

**04.** පොළොන්නරුවෙන් පසුව පාලන මධ්‍යස්ථානය තෝරා ගැනීමේදී පාලකයින්ගේ අවධානය යොමු වූ කරුණු 02ක් සඳහන් කරන්න

**05.** දෙවන නාගරීකරණ අවධියේදී උස් පර්වත ආශ්‍රිතව බිහිවූ පාලන මධ්‍යස්ථාන 02ක් නම් කරන්න

**06.** දඹදෙණියේ  දෙවන පරාක්‍රමබාහු රාජ්‍යකාලයේ වැදගත්කම කෙටියෙන් සඳහන් කරන්න

**07.** දෙවන නාගරීකරණ අවධියේදී මෙරට ආර්ථික රටාව පිළිබඳ සැකවින් විස්තර කරන්න

**08.** කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දේශපාලන ස්ථාවරභාවයක් ඇතිකිරීමට කටයුතු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න

**09.** "දෙවන නාගරීකරණ අවදියේදී මෙරට භාෂාව හා සාහිත්‍ය යෙහි විශාල ප්‍ර බෝධයක් ඇති විය" මේ පිළිබඳ පහත කරුණු 02 යටතේ විස්තර කරන්න.

1. සාහිත්‍ය කෘති බිහිවීම.
2. උගත් පඬිවරුන් බිහිවීම.

**10.** පහත සඳහන් කරුණු පිළිබඳ කෙටි සටහන් ලියන්න.

1. යාපනය රාජධානිය
2. වන්නියාර්වරු


**11.** පහත සඳහන් ප්‍රශ්න සඳහා රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න

A.



I. මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නනේ කුමක්ද?
II. මෙය ඉදිකළ පාලකයා කවුද?
III. මෙය කුමන සියවසකට අයත්ද?
IV. මෙහි විශේෂත්වය කුමක්ද?

B.



I. මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
II. මෙය පිහිටා ඇත්තේ කුමන නගරයකද?
III. මෙය ඉදිකළ පාලකයා කවුද?
IV. මෙම යුගයේ ඉදි වූ විදෙස් ආභාශය ලද තවත් ගොඩනැඟිල්ලක් නම් කරන්න

**12.පහත සඳහන් ස්ථාන ශ්‍රී ලංකා ආකෘති සිතියමක ලකුණු කර නම් කරන්න**

1. **යාපනය**
2. **පොළොන්නරුව**
3. **කුරුණෑගල**
4. **දඹදෙණිය**
5. **ගම්පොළ**
6. **යාපහුව**
7. **සීතාවක**
8. **කෝට්ටේ**
9. **රයිගම**
10. **පඬුවස් නුවර**


**සැකසුම-**

**එන්.එල් සිරිමාන්න**

**කෑ/දෙහි/මාගල කනිෂ්ඨ විද්‍යාලය, මාලිබොඩ.**